| වෙන්නප්පුව අධ්‍යාපන කොට්ඨාසය |
|---|
| පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට<br>පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන පෙරහුරු විභාගය - 2023 |
| නම/ විභාග අංකය :...................................................................... කාලය: පැය 1 මි. 15 |

1. ඡේදය කියවා අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

"මේ මිහිතලයේ සැම බිම් අඟලක් ම මගේ පරපුරට ශුද්ධ වූ වස්තුවකි. දිලිසෙන දේවදාර ගසක සැම කිනිත්තක් ම වැලිතලාවලින් පිරී ගිය සැම වෙරළක් ම අඳුරු වනාන්තරවල තිබෙන සැම මිහිදුම් වලාවක් ම සිහින් හඬින් ගී ගයන සැම කුඩා ප්‍රාණියෙක් ම මගේ මිනිසුන්ගේ මතකයේ හා අත්දැකීම් සමුදායේ පූජනීය වූ වස්තුහු වන්නෝය. ගස් අතරින් විහිදී යන සැම අඩි පාරක් ම මිනිසා පිළිබඳ ස්මරණය රැගෙන යන්නේ ය. අප මිහිතලයේ කොටසක් වන අතර ම මිහිතලය ද අපගේ ම කොටසකි.

"ගංගාවෝ අපගේ සොහොයුරෝ වෙති. ඔවුහු අපගේ පිපාසය සංසිඳවති. අපගේ ඔරු ද පාරු ද ගෙන යති. අපගේ දරුවන් පෝෂණය කරති."

i. මෙම අදහස් ප්‍රකාශ කළේ කවුද ? ...........................................................................................

ii. මෙහි සඳහන් පූජනීය වස්තුවක් ලියන්න. ...................................................................................

iii. උත්තම පුරුෂ බහුවචන අනුක්ත පදයක් ඡේදයෙන් සොයා ලියන්න. ...........................................................

iv. ඡේදයේ සඳහන් අප්‍රාණවාචී බහුවචන නාම පදයක් ලියන්න. ......................................................................

v. නාම විශේෂණ පදයක් ඡේදයෙන්ම සොයා ලියන්න. ...........................................................................

vi. මෙහි සඳහන් වර්තමාන කාල බහුවචන ක්‍රියාපදයක් ලියන්න. ............................................................

1x6

2. පහත වචනවල අරුත් පැහැදිළි කරන්න.

i. ගිරි ශිඛර - ..........................................................................................................

ii. ස්මරණය - ..........................................................................................................

1x2

3. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

i. ප්‍රථමාධාර / ප්‍රථමාදාර

ii. අර්ථවත් / අර්තවත්

4. දී ඇති වචන ගලපා අර්ථවත් වැකි ගොඩනගන්න.

i. යුතුකම / මිනිසාගේ / පරම / කිරීමයි / මිනිසාට / සේවය

..........................................................................................................

ii. වර්ගයට / පක්ෂියෙක් / කහපාට / කැනේරි / කුඩා / ක්ලැරිබෙල් / අයත්

1x2

..........................................................................................................

5. සුදුසු විරාම ලකුණු යොදන්න.

මොන විකාරයක්ද එකිනෙකින් ස්වාධීනව ක්‍රියා කරන පරිපථ දෙකක් මෙහි තිබෙනවා

1x1

6. ලිඛිත බසට හරවා ලියන්න.

පිළිහුඩුවා මාළුවෙකු ඩැහැගැනීමට මාන බලමින් සිටියා.

............................................................................................................................................................ 1x1

7. හිස්තැන් සම්පූර්ණ කරන්න.

ඇවිලෙන ගින්නට ........................................................................................................................ 1x1

8. අවට සමාජය පිළිබඳ නිසි දැනුමක් නැති යන අදහසට ගැළපෙන යෙදුම ලියන්න.

............................................................................................................................................................ 1x1

9. ස්ත්‍රී ලිංග පදය ලියන්න.

i. අශ්වයා - ...................................................................

ii. මාළුවා - ...................................................................

1x2

10. පහත වාක්‍යයේ ගැළපෙන උක්ත පදය තෝරන්න.

.................................................... උදෑසන අවදි වී පාසලට යයි. ( ළමයෙක් / ළමයෙකු ) 1x1

11. පහත වාක්‍යවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( ✗ ) ලකුණ ද යොදන්න.

i. නංගී මල් කැඩුවාය. ( )

ii. සමහරෙක් පාඩම් පොත් කියවති. ( )

iii. තාරකා අහසේ බබළති. ( )

iv. නෞකාවෝ මුහුදේ ගමන් කරති. ( )

1x4

12. තෝරන්න.

සීමා දැනගෙන එහෙ මෙහෙ යන්නේ<br>
සතුටේදි දුකේදි නිතර තෙමෙන්නේ<br>
අනතුරකට නම් නෑ ඉඩ දෙන්නේ<br>
දොරටු දෙකෙන් ඉක්මනට වැසෙන්නේ

1x1

....................................................

13. ඉංග්‍රීසි භාෂාවෙන් ලියන්න.

i. මදුරුවා - .................................................................... ii. දේදුන්න - ........................................................ 1x2

සිංහල භාෂාවෙන් ලියන්න.

iii. squirrel - ........................................................ 1x2

iv. I am drinking water. - ..........................................................................................................................

14. වචන ගළපා වැකියක් තනන්න.

help / you / do / homework / I / to / your 1x1

..........................................................................................................................................

15. පහත වැකි දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

i. අහස නිල් පාටයි - ......................................................................................................

ii. මට පැන දෙන්න - ......................................................................................................

සිංහල භාෂාවට හරවන්න.

iii. උංගළ් පාඩසාලෛ එඳු? - .............................................................................................. 1x3

16. පහත ඡේදයේ දක්වා ඇත්තේ වනාන්තරයක් තුළ එක් නිමේෂයක් තුළ දී සිදුවූ සිදුවීමකි.

නිල් පැහැයෙන් වන ලැහැබම වෙළාගෙන ඇත. ගස් අතරින් හමන්නා වූ සීත සුළඟ ගතෙහි විඩාව නිවා දමයි. දිය බී ඔබ මොබ හැසිරෙන මුව රංචුව වනයෙහි නිහැඬියාව මදක් බිඳ දමති. එක්වරම මහා හඬක් නගමින් වඳුරු රැළ අතු මතින් හනි හනිකට පැන දුවන්නට වූහ.
මින් පසු සිදු වුණේ කුමක්දැයි සිතා ඔබේ අදහස වචන පහකට නොඅඩු වැකි 3කින් ලියා දක්වන්න. උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතුය.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

.......................................................................................................................................... 2x3

17. 49093 ට සංඛ්‍යාවට 9ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යා නාමය ලියන්න.

..........................................................................................................................................

18. ටොෆි 876ක් 8 බැගින් පාර්සල් කළ විට පාර්සල් කීයක් සෑදිය හැකිද?

..........................................................................................................................................

19. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් 2808 ක් ඇත. අනෙක් පාසල් 7311 ක් ඇත. ප්‍රාථමික පාසල්වලට වඩා අනෙක් පාසල් කීයකින් වැඩිද?

.......................................................................................................................................... 1x3

20. එකක් රු. 12.50 ක් වටිනා පැන්සල් දුසිමක් මිලට ගැනීමට අවශ්‍ය මුදල කීයද?

.............................................................................................................................................

21. $1.5\ l$ සිසිල් බීම බෝතලයකින් $225\ ml$ බැගින් වීදුරු 6කට වත්කළ පසු බෝතලයේ ඉතිරි වන ප්‍රමාණය මිලි ලීටර් කොපමණද?

.............................................................................................................................................

1x2

22. තාත්තා 64km ක ගමනක් $\frac{3}{4}$ ක් දුම්රියෙන් ද ඉතිරි දුර බසයෙන් ද ගියේය. තාත්තා බසයෙන් ගිය මුළු දුර කොපමණද?

.............................................................................................................................................

23. මෙම රූපයේ අඳුරු කර ඇති කොටස මුළු රූපයෙන් කීයෙන් පංගුවක්ද?



.............................................................................................................

24. චිත්‍ර ප්‍රදර්ශනයක් නැරඹීමට පළමු දිනයේදී 1350 ක්ද දෙවන දිනයේ දී පළමු දිනට වඩා 275 ක් අඩුවෙන් ද තෙවන දිනයේ දී දෙවන දිනයට වඩා 850 ක් වැඩියෙන් ද පැමිණියේ නම් දින 3 දීම පැමිණි ගණන කොපමණද?

.............................................................................................................................................

25. දොඩම් ගෙඩියක මිල රු. 15.50 කි. කපිල දොඩම් ගෙඩි 6ක් ගෙන වෙළෙන්දාට රු. 100.00 ක් දුන්නේ නම් කපිලට ලැබෙන ඉතිරි මුදල කීයද?

.............................................................................................................................................

26. i. රූපයේ ඇති සෘජුකෝණාස්‍ර ගණන කීයද?



.............................................................................................................................................

ii. රෙදි මීටරයක මිල රු. 148.00 ක් නම් රෙදි මීටර 3.5 ක මිල කීයද?

.............................................................................................................................................

27. කුමාරි පැය 2 මිනිත්තු 30ක් එක් දිගටම පොතක් කියවා ප.ව. 1.30ට පොත කියවා අවසන් කළාය. ඇය පොත කියවීමට පටන් ගත් වෙලාව කීයද?

.............................................................................................................................................

28. මෙම සමපාද ත්‍රිකෝණයේ ඇඳිය හැකි සමමිතික රේඛා සියල්ල දක්වන්න.



29. පහත ඔරලෝසු මුහුණත්වල පැය කටුව හා මිනිත්තු කටු සෘජුකෝණයක් ලෙස පිහිටන අවස්ථා 2ක් අඳින්න.







30. 

| 3 5 8 |
|---|

කොටුව තුළ ඇති ඉලක්කම් තුනම යොදාගෙන සෑදිය හැකි සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට ලියන්න.

…………………………………………………………………………………………

31. i. පහත රූපයේ පාට කර ඇති කොටස දශම සංඛ්‍යාවක් සේ දක්වන්න.



…………………………………………………………………………………………

ii. අවුරුද්දකට ඇති සති ගණන කොපමණද? ……………………………………………………………

2x15

- **පහත ප්‍රශ්නවලට වඩාත් සුදුසු නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

32. ශ්‍රී ලංකිකයන් ලෙස ජීවත් වීමේ දී අප ළඟ තිබිය යුතු ගුණාංගයකි,

i. ආගම් විවේචනය කිරීම.

ii. සෑම දෙනාටම ගරු නොකිරීම.

iii. අනෙක් ජාතින් හා ආගමිකයන් සමඟ සහයෝගයෙන් සිටීම.

33. විටමින් C බහුල ආහාර කාණ්ඩයකි,

i. ගස්ලබු , අඹ , ලාවුළු      ii. දෙහි , දොඩම් , නාරං      iii. මිදි , අනෝදා , මැංගුස්

34. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතින් මුහුදට වැටෙන ගංගා දෙක වන්නේ,

i. මහවැලි ගඟ සහ කැලණි ගඟ

ii. වලවේ ගඟ සහ කළු ගඟ

iii. කැලණි ගඟ සහ කළු ගඟ

35. පුවක් , වරකා , හොර යන බීජ ව්‍යාප්තිය සිදුවන පිළිවෙළ වන්නේ,

i. සතුන් මඟින් , ජලය මඟින් , සුළඟ මඟින්.

ii. ජලය මඟින් , සතුන් මඟින් , සුළඟ මඟින්.
iii. ජලය මඟින් , සුළඟ මඟින් , සතුන් මඟින්.

36. ඒකදේශික ශාකයක් හා සත්වයෙකු පිළිවෙළින් අඩංගු පිළිතුර තෝරන්න,

i. රත්මල් හා කැහිබෙල්ලා   ii. පොල් හා හික්මීයා   iii. මාවේවැල් හා කළු වඳුරා

37. රාජ්‍ය ලාංඡනයේ ඇති පලාපෙති මඟින් අර්ථවත් වන්නේ,

i. සෞභාග්‍යය   ii. ස්වයංපෝෂිත බව   iii. පාරිශුද්ධ බව

38. බරැති ද්‍රව්‍යයක් එහි මෙහා කිරීමට උදව් කර ගත නොහැකි වන්නේ,

i. කප්පිය   ii. විල් බැරෝව   iii. දඬුඅඬුව

39. සිදුරු කැමරාවක් මඟින් යමක් දෙස බැලූ විට දැකිය හැකි ආකාරය වන්නේ,

i. 

ii. 

iii. 

40. ශාකයක ආහාර නිපදවනු ලබන්නේ,

i. මුල්වල ය.   ii. කඳේය.   iii. පත්‍ර වලය.

41. දැති රෝද හා දම්වැල උදව්වෙන් ක්‍රියාත්මක වන උපකරණයක් නොවන්නේ,

i. මහන මැෂිමය.   ii. පා පැදිය.   iii. යතුරු පැදිය.

42. අපේ අතීත මුතුන් මිත්තන් ලුණු මිශ්‍ර ජලයේ බීජ දැමුවේ,

i. බීජ පැළවීමට පහසු වීම සඳහාය.
ii. බීජ ලුණු මිශ්‍ර ජලයේ හොඳින් පැළවීම සඳහාය.
iii. හොඳ වී හා බොල් වී වෙන් කර ගැනීම සඳහාය.

43. ප්‍රදේශයේ කුණු කසළ ඉවත් කරමින් පරිසරය පිරිසිදු කර ගැනීමට කටයුතු කරන ආයතනය වන්නේ,

i. පරිසර සංවර්ධන අධිකාරිය.
ii. නගර සභාව.
iii. නාගරික සංවර්ධන අධිකාරිය.

44. පහත රෝග අතරින් බෝ නොවන රෝගයක් වන්නේ,

i. අධි රුධිර පීඩනය. ii. ඩෙංගුය. iii. පාචනය.

45. ඉතා අලංකාර මල් හට ගන්නා නමුත් විෂ සහිත අල ඇති ශාකයක් වන්නේ,

i. බාඳුරා. ii. පෙනෙල. iii. නියඟලා.

46. ඒප්‍රණය අත්‍යවශ්‍ය වන්නේ,

i. හෙදියට. ii. ගායකයාටය. iii. කෝකියාට.

47. අනාරක්ෂිත ආහාර ගැනීමෙන් වැළදෙන රෝගයක් වන්නේ,

i. ඩෙංගු ii. වමනය iii. මැලේරියා

48. වර්ෂාව අඩුවෙන් ලැබෙන දිස්ත්‍රික්කයකි,

i. ගාල්ල. ii. පුත්තලම. iii. මහනුවර.

49. දණ්ඩ චුම්බකය දැක්වෙන රූපය තෝරන්න,

i. 


ii. 


iii. 

50. බිත්තර දමන සතෙකු නොවේ,

i. වවුලා. ii. කපුටා. iii. මයිනා.

51. ලංකාවේ පළමු වැව වන්නේ,

i. මින්නේරි වැව ii. කලා වැව iii. බසවක්කුලම වැව

52. සන්නිවේදනයේ අංගයක් නොවේ,

i. යවන්නා. ii. සුරකින්නා. iii. ලබන්නා.

53. මදුරුවන් පලවා හැරීමට ඇගේ තැවරිය හැකි තෙල් වර්ගයක් වන්නේ,

i. පොල් තෙල් ii. පැඟිරි තෙල් iii. භූමිතෙල්.

54. ඖෂධයක්, විෂබීජ නාශකයක් හා කෘමි නාශකයක් වශයෙන් භාවිතා කරන්නේ,

i. වෙනිවැල් ii. නිදිකුම්බා iii. කොහොඹ

55. වෙළඳ පොළෙන් පැණි බීම (පාන වර්ග) මිල දී ගැනීමේ දී ශරීර සෞඛ්‍යයට වඩාත් හිතකර සංකේත රවුමේ වර්ණය වන්නේ,

i. කහ ii. කොළ iii. රතු

56. කොළ කැබලි ඉරා අලවා නිර්මාණය කරන චිත්‍ර හඳුන්වනු ලබන්නේ,

i. මෝස්තර ii. කොලාජ් iii. සීල් මුද්‍රණ

57. ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළක් පිහිටි නගරයක් නොවේ,

i. පලාලි ii. කුරුණෑගල iii. මත්තල

58. රාත්‍රී කාලයේ පිපී අලුයම් කාලයේ දී පරවෙන පුෂ්පය වන්නේ,

i. හෙන්දිරික්කා මල ii. කඩුපුල් මල iii. සේපාලිකා මල

59. ලොරියකට තෙල් බැරල් පැටවීම සහ බෑම සඳහා සුදුසු ක්‍රම ශිල්පයකි,

i. දැති රෝද භාවිතය ii. ආනත තල භාවිතය iii. කප්පි භාවිතය

60. වාහනයක තිරිංග තද කරන විට දැල්වෙන බල්බයේ වර්ණය වන්නේ,

i. සුදු ii. කහ iii. රතු

61. අප රට ආක්‍රමණය කළ පළමු යුරෝපීය ජාතිය වන්නේ,

i. ඉංග්‍රීසි ii. පෘතුගීසි iii. ලන්දේසි

1x30